# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVI    YEAR OF OUR LORD JESUS CHRIST, FEBRUARY 2022    Issue No. 3


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 20:1-9)**

1. විපත්ති දවසේදී ස්වාමීන්වහන්සේ නුඹට උත්තරදෙනසේක්වා, යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ නාමය නුඹ උසස්කෙරේවා,

2. ශුද්ධස්ථානයෙන් නුඹට පිහිට එවනසේක්වා, සියොන්හි සිට නුඹ ශක්තිමත් කරනසේක්වා,

3. නුඹේ පූජා සියල්ල සිහිකරනසේක්වා, නුඹේ දවන පූජාව පිළිගන්නාසේක්වා,

4. නුඹේ සිත් ආශාව ලෙස නුඹට දෙනසේක්වා, නුඹේ මන්ත්‍රණ සියල්ල ඉෂ්ඨකරනසේක්වා.

5. නුඹේ ගැළවීම ගැන අපි ජය ඝෝෂාකරන්නෙමුව, අපේ දෙවියන්වහන්සේගේ නමින් අපගේ කොඩි නඟන්නෙමුව. ස්වාමීන්වහන්සේ නුඹේ සියලු ඉල්ලීම් ඉෂ්ඨකරනසේක්වා.

6. ස්වාමීන්වහන්සේ තමන් අභිෂේකලත් තැනැත්තා ගළවන බව දැන් දනිමි, උන්වහන්සේ තමන් ශුද්ධ වූ ස්වර්ගයේ සිට, තමන් දකුණතේ ගැළවීමේ ශක්තියෙන් ඔහුට උත්තරදෙනසේක.

7. සමහරු රථ කෙරෙහිද අශ්වයන් කෙරෙහිද විශ්වාසකෙරෙති. නුමුත් අපි අපේ දෙවිවූ ස්වාමීන්ගේ නාමය සඳහන්කරන්නෙමුව.

8. ඔව්හු නැමී වැටී සිටිති. නුමුත් අපි නැඟිට කෙළින් සිටිමුව.

9. ස්වාමිනි, ගැළවුව මැනව. අප හඬගසන කල රජ්ජුරුවෝ අපට උත්තරදෙනසේක්වා.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පෙළපතෙහි ආබ්‍රහම් හා දාවිත් ගැන පමණක් සඳහන් කර ඇත්තේ ඇයි?

(Why the genealogy of Jesus Christ Precedes Abraham and David only ?)

*Bro. M. Paulraj*

මතෙව් ශුභාරංචියෙහි 1:1 හි මේ ආකාරයට සඳහන් කර ඇත. ***"ආබ්‍රහම්ගේ පුත්‍රයා වන දාවිත්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පරම්පරාවේ පොතය"*** යේසුස්වහන්සේගේ පෙළපත ගැන සඳහන් කර ඇති අතර එය ආරම්භ කරන්නේ ආබ්‍රහම්ගේ සිට යෝසෙප්දක්වා පරම්පරාවෙනි. මේ පරම්පරා 42 අතුරින් දෙවියන්වහන්සේට ප්‍රමුඛස්ථානයක් දෙනු ලබන්නේ ආබ්‍රහම්, දාවිත් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේටය. මෙම නම් වලින් විශේෂ බලපෑමක් ඇති කර ඇති බැවින් ඔවුන්ව මෙහි සඳහන් කර ඇත. එබැවින් මෙම විශේෂ නම් වන ආබ්‍රහම්, දාවිත් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අප තොරතුරු ටිකක් බලමු.

## ආබ්‍රහම්

ආබ්‍රහම් තේරාගේ පුත්‍රයාය. රූප නමස්කාරයෙන් පිරුණාවූ මෙසොපොතමියා දේශයෙහි ඔහු වාසය කළේය. දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට කථාකොට උන්වහන්සේ පෙන්වන්නාවූ ඉතා ඈත දේශයටකට යාමට ඔහුව කැඳෙව්වේය. දෙවියන්වහන්සේ ආබ්‍රහම්ටත් ඔහුගේ පරම්පරාවටත් මේ පොළොවේදී ආශිර්වාද කරනවාය කියා පොරොන්දු විය. ***(උත්පත්ති 12:1-3/ක්‍රියා 7:2-4)*** ආබ්‍රහම්ගේ පියා ද ආබ්‍රහම් ද ඔහුගේ බිරිඳ වන සාරා හා ඔහුගේ මුණුබුරා වන ලොත් ද රැගෙන කානාන්ට යන මාර්ගයේ ඌර් නම් ස්ථානයෙහි පදිංචි විය. එම හාරාන් යන ස්ථානයෙහි වසර 30-40 දක්වා කාලයක් ඔවුන් එහි ජීවත් විය. ඉන්පසු නැවත දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට තම බිරිඳ හා ලොත්වද ඔහු සමග යනවාට දෙවියන්වහන්සේ කැමති නොවීය. මන්ද ඔවුන් තවත් පවුලක් සමග මිශ්‍ර වී සිටින විටදී දෙවියන්හන්සේ පවුලකට ආශිර්වාද කිරීමට නොහැකිය. මෙම පවුල කානාන්ට ඇතුල් වී ශෙකෙම් නැමැති ස්ථානයෙහි පදිංචි විය. පසුව එම ස්ථානයෙන් බෙතෙල්ට ගොස් කුඩාරම් ගසා ගත්තේය. දෙවියන්වහන්සේ නැවත ආබ්‍රහම්ට කථාකොට කානානිවරුන්ගේ දේශය දෙන බවට පොරොන්දු විය. ***(උත්පත්ති 12:7)*** අබ්‍රහම්ට ගවයින්, බැටළුවන්, රන් හා රිදී බොහෝ සෙයින් තිබූ නිසා ඔහු පොහොසතෙක්ව සිටියේය. ආබ්‍රහම්ට මෙන්ම ලොත් ට ද බොහෝ බැටළුවන් හා ඒවා බලාගන්නට එඬේරුන් ද සිටියෝය. ඔවුන්ගේ එළුවන් හා බැටළුවන් බලා ගැනීමට එඬේරු සිටියෝය. ඔවුන්ගේ එඬේරු අතර ප්‍රශ්න හා ගැටළු ඇති වූ බැවින් ආබ්‍රහම් හා ලොත් සමාදානයෙන් වෙන්වීමට තීරණය කළේය. ලොත් සොදොම් හා ගොමෝරා යන ස්ථානය තෝරා ගත්තේය. සොදොම් හා ගෝමෝරාවට විරුද්ධව රජවරුන් 5 දෙනෙක් පැමිණ ඔවුන් හා සමග සටන් කොට ලොත්ගේ භාර්යාව හා අයිති සියල්ල ද රැගෙන ගියේය. මේ

3 වෙනි පිටුවට ...

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

*from your dearly beloved brother...*



## කැඳවීමේ ප්‍රතිරාවය

"මම මාගේ සෙනඟ වූ ඉශ්‍රායෙල්ගේ වහල්කම පහකරන්නෙමි...."
(ආමොස් 9:14)



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


CHIEF EDITOR

Angeline Selvakumari Henry, M.A., M.Ed.

MANAGING EDITOR

Pastor Alex Samson Sam, B.Th., M.Div.

ADMINISTRATION

Bro. N. Prakasam, M.A., General Manager

EDITORIAL BOARD

Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.

EDITOR, PUBLISHER & PRINTER

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

E.mail ID

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

WEBSITES

www.echoofhiscall.org
www.stpaulsmatriculation.com


**ප්‍රිය සහෝදර සහෝදරිය,**
**අපගේ ස්වාමි වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහ්සේගේ මිහිරිමත් වූ නාමයෙන් අපි ඔබට සුභ පතමු.**

දෙවියන්වහන්සේ 2021 දෙසැම්බර් මාසයේ සහ 2022 ජනවාරි මාසයේ අපගේ සියලුම සේවාවන් වලට ආශිර්වාද කලේය. අප ඉතා අනර්ඝවූ නත්තල් දේව මෙහෙයක් හා අලුත් අවුරුදු දේව මෙහෙයක් පැවැත්වීමු. එසේම සබත් පාසැල් දරුවන්ගේ සේවයට හා නෙහෙමියා බයිබල් විදුහලේ Online පාඩම් මාලාවන් වලටද දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කලේය.

2022 ජනවාරි මස 3 වන දිනදී හින්දි භාෂාවෙන් අප ආරම්භකල Online පාඩම් වලට බොහෝ ශිෂ්‍යයින් එකතු විය. අප මෙය පවත්වන්නේ උතුරු ඉන්දියාවේ සිටින හින්දි භාෂාව කථා කරන්නාවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිසාය.

ළමා සේවයෙහි යෙදීම සඳහා ඉතාම අනර්ඝ කණ්ඩායමක් දෙවියන්වහන්සේ අපට දී තිබේ. එහි ඡායාරූපයක් අප මෙහි එලකර ඇත. ඔබගේ යාච්ඤාවේදී ඔවුන්වද ඔසවන්න කියා අප ඔබගෙන් ඉල්ලා සිටිමු.

අප ඔබ සැමගෙන් ඉල්ලා සිටින්නේ බයිබල් විදුහලේ සභාපති වන පාස්ටර් මුත්තු තවමත් අසනීප තත්වයෙන් සිටින නිසා ඔහු ගැනද කැදවීමේ ප්‍රතිරාවය සඟරාවේ උප කර්තෘ වන සහෝදර පෝල් රාජ් යන මේ දෙදෙනාගේම සුවය උදෙසාද කරුණාකර යාච්ඤා කරන ලෙසය. මේ අය ඉතා අගනාවූ සේවයක් කරන්නාවූ අයයි.



මේ නව වසරේදී දෙවියන්වහන්සේ ඔබට විශාල මහත්වූ දේ කරන පිණිස අප ඔබ උදෙසාද යාච්ඤා කරමු.
දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා...

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

*1 පිටුවෙන්....*

බව දැනගත් ආබ්‍රහම් ඔහු සමග සිටි සටන් කිරීමට හැකි සේවකයින් 318 දෙනෙක් ද රැගෙන ගොස් ඔවුන් සමග සටන් කොට ලොත් ද ඔහුගේ පවුල ද අනෙකුත් සියලු දෙනාව ද ඔවුන්ගෙන් පැහැර ගෙන ගිය බඩු ද නැවත රැගෙන ආවේය. ඔහු නැවත එන කල්හි සාලෙම්හි රජු වන මෙල්කිසදෙක් නැමැති පූජකයා ආබ්‍රහම්ට හා ඔහුගේ සේවකයින්ට රොටී හා වතුර ගෙනවිත් දුන්නේය. ආබ්‍රහම්ද මේ උත්තම පූජකයා වන මෙල්කිසදෙක්ට දසයෙන් කොටස දුන්නේය. ***(උත්පත්ති 14:16-30)***

## මේ මෙල්කිසදෙක් යනු කවුද?

මෙල්කිසදෙක් සාලෙම් හි රජෙක් හා මහෝත්තම දෙවියන්වහන්සේගේ පූජකයාව. ආබ්‍රහම් සෑම දේ තුළින්ම දසයෙන් එක දුන්නේය. මෙල්කිසදෙක් යන නමෙහි තේරුම නම් සමාදානයේ රජය. සාලෙම් යනු සමාදානයයි. එනම්, සමාදානයේ රජෙකි. ඔහුගේ පටන්ගැන්මක් හෝ අවසානයක් නැත. ඔහුගේ දෙමාපියන් නාමයන්ද සඳහන්ව නැත. එහෙත් ඔහු දෙවියන්වහන්සේගේ පුත්‍රයා මෙන් දිගටම පූජකයෙක්ව සිටියේය. තවද ඔහු ධර්මිෂ්ඨ වූ රජෙක් ලෙස දෙවියන්වහන්සේ විසින් පත්කළාවූ තැනැත්තාය. ආබ්‍රහම්ට ආශිර්වාද කිරීමට දෙවියන්වහන්සේ විසින් තෝරාගත්තාවූ ඇතුල්වීමේ මාර්ගය මෙයයි. අනෙක් දෙදෙනා වන දාවිත් සහ යේසුස්වහන්සේ මෙල්කිසදෙක් කරණකොටගෙන ආශිර්වාද ලැබූ බවට සඳහන් වී නොමැත. නමුත් මේ තැනැත්තා රජෙක් ලෙසත් පූජකයෙක් ලෙසත් සියලු සුදුසුකම් ලබා සිටියේය.

## රජවරුන් හා පූජකවරුන්

දෙවියන්වහන්සේගේ රාජයයේ දී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, අපව පත්කරගෙන සිටින සේක. ***(එළිදරව් 1:6)*** මෙය අපට කොපමණ අනර්ඝ ඉඩ ප්‍රස්ථාවක්ද?

දාවිත්ද රජෙක් ලෙසත් පූජකයෙක් ලෙසත් ක්‍රියා කළේය. ඔහු ඉශ්‍රායෙල් හි රජෙක් ලෙසත් ස්වාමීන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටියේ පූජකයා ලෙසත් ගිවිසුම් පෙට්ටිය යෙරුසෙලමට රැ ගෙන ආවේය.

තවද දාවිත් දෙවියන්වහන්සේගේ ගිවිසුම් පෙට්ටිය ගෙනෙන විට එය ඉදිරියේ ඔහු රාජ වස්ත්‍ර පළඳමින් පූජකවරුන් තබාගෙන සිටින්නාවූ ඒපොද්ද දරාගෙන සිටියේය. තවද ඔහු මේ ගිවිසුම් පෙට්ටිය ඉදිරියේ රජෙක්ව සිටියාවූ තමාවම යටත් කරමින් නටමින් ස්වාමීන්වහන්සේට ප්‍රශංසා කලේය. තවද දාවිත් යෙරුසෙලමෙහි ඔහු විසින් සෑදුවාවූ කූඩාරමක මෙම ගිවිසුම් පෙට්ටිය තැබුවේය. ***(2 සාමුවෙල් 6:13-15)*** දාවිත් රජෙක් හා පූජකයෙක් ලෙස ක්‍රියා කලත් ඔහුගේ කාලය තුලදී ඔහු බොහෝ යුද්ධ කල නිසා දෙවියන්වහන්සේ ඔහුට දේව මාළිගාවක් සෑදීමට ඉඩ නොදුන්නේය.

## ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

***සෙකරියා 9:9*** පදයෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේව රජෙක් ලෙසත් ***හෙබ්‍රෙව් 7:16-17*** පදවල යේසුස්වහන්සේ උත්තම පූජකයා ලෙසත් අපට පෙන්වා ඇති අතර ***ගීතාවලිය 110:4*** පදයෙහි දාවිත් රජතුමාද මෙසේ පවසා ඇත. ''***නුඹ මෙල්කිසදෙක්ගේ පිළිවෙළින් සදාකාලයටම පූජකයෙකැයි ස්වාමීන්වහන්සේ දිවුළ සේක, එය වෙනස් නොකරනසේක.***''

## අලුත් ගිවිසුමේ මුල පිරීම

ආබ්‍රහම්ට වයස අවුරුදු 99 ක් ව සිටි විටදී ස්වාමීන්වහන්සේ ඔහුට දර්ශනය වී මෙසේ පැවසුවේය. ''මම සර්වබලධාරී දෙවියන්වහන්සේය. මා ඉදිරියෙහි නුඹ නිර්දෝශව ගමන් කරන්න.'' යනුවෙනි. මෙය ආබ්‍රහම්ට දුන් අවවාදයකි. මන්ද දෙවියන්වහන්සේගේ පොරොන්දුව ඉෂ්ඨවන තුරු ඔහු බලා සිටියේ නැත. ඔහු යම් වැරදි ක්‍රියාවන් කළ නිසා ඔහුගේ පොරොන්දුවේ දරුවා එන්නට ප්‍රමාද විය.

(1). ඔහු කානාන් දේශයේ ආහාර හිඟයක් ඇති වූ කල්හි ආබ්‍රහම් සාරා සමඟ මිසර දේශයට ගියේය. එහිදී ඔහු ඔහුගේ බිරිඳ වූ සාරා තමාගේ සහෝදරිය කියා පවසනු ලැබීය. මිසරවරු ඔහුට ඔහුට හානියක් කරයි කියන භය නිසා ඔහු එම බොරුව පවසන ලදි. ඵාරාවෝ සාරාව ඔහුගේ මාළිගාවට ගෙන ගියේය. ආබ්‍රහම්ව හොඳින් බලාගත්තේය. ඔහුගේ සේවකයින් අතර හාගර්ද සිටියේය. දෙවියන්වහන්සේ ඵාරාවෝට පීඩාවන් එවුවෝය. ඔහු ඔහුගේ වරද දුටු කල ආබ්‍රහම්ද ඔහු සමඟ සිටි සියල්ලටන්ද යන්නට පවසා සාරාවද නැවත ඔහුට දුන්නේය. මේ ස්ථානයේදී ආබ්‍රහම් ස්වාමීන්වහන්සේගේ උපදෙස් අසන්නේ නැතිව ක්‍රියා කලේය.

(2). දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට දර්ශනය වී ඔහුට ආශිර්වාද කරන බවට නැවත පොරොන්දු විය. තවද ආබ්‍රහම් දෙවියන්වහන්සේට පවසනු ලැබුයේ, ඔහුගේ උරුමක්කාරයා එලෙයාසර් සිටින බවයි. නමුත් දෙවියන්වහන්සේ ඔහුට, නැහැ, මම ඔබගේ ගර්භයේ ඵලයට ආශිර්වාද කරමි. අහසේ තාරකා දෙස බලන්න. මම නුඹ අහසේ තාරකා මෙන් වැඩි කරමි'යි කියා ඔහුගේ 75 වන වයසේදී පවසනු ලැබීය. එහෙත් එලෙයාසර් ඔහුගේ දරුවෙන් වන බව ආබ්‍රහම් සිතුවේය. ***(උත්පත්ති 15:1-15)***

(3). පොරොන්දුවේ පුත්‍රයාගේ පැමිණීම ප්‍රමාද වූ නිසා ආබ්‍රහම් යුවලගේ ඉවසීම නැති විය. සාරා තම මෙහෙකාරිය වූ හාගර්ව ආබ්‍රහම්ට දුන්නේය. ආබ්‍රහම් එය ප්‍රතික්ෂේප කලේ නැත. ආබ්‍රහම්ට වයස අවුරුදු 88 ක්ව සිටියදී ඔහු ඈ සමඟ සයනය කර එහි ප්‍රතිඵලයක් ලෙස ඉෂ්මායෙල් නැමති දරුවා බිහි කලේය.

දෙවියන්වහන්සේ මේ ක්‍රියාව ගැන සතුටු වූයේ නැත. ආබ්‍රහම්ම වයස අවුරුදු 99 වන තුරුම දෙවියන්වහන්සේ ඔහුට කථා කලේ නැත. තවත් කාන්තාවක් සරණපාවා ගැනීම එම කාලයේ පාපයක් නොවීය. නමුත් ආබ්‍රහම්ව දෙවියන්වහන්සේ තෝරාගනු ලැබුයේ, විශේෂ දෙයක්

නිසාය. ඔහු පොරොන්දුව දෙස නොබලා දෙවියන්වහන්සේ ට අකීකරු විය.

එම නිසා දෙවියන්වහන්සේ ඔහුට කථා කර, ''මා ඉදිරියෙහි නිර්දෝශව ගමන් කරන්න'' කියා පවසනු ලැබීය. දෙවියන්වහන්සේ ආබ්‍රහම් සමඟ නව ගිවිසුමක් ඇතිකර ගනිමින් ඔහුට දාව ඉපදෙන දරුවාවත් ඔහුගේ පරම්පරාවේ, සියලු දරුවන් චර්මච්ඡේදනය කරන්නය කියා පවසනු ලැබීය. දෙවියන් වහන්සේගේ පොරොන්දුවට අනුව ඔහුව බොහෝ ආශිර්වාද කරමින් වැඩි කර බවයි. ආබ්‍රම්ගේ නම වෙනස් කරමින් ආබ්‍රහම් ලෙස මාරු කලේය. මන්ද ඔහු බොහෝ ජාතීන්ගේ පියෙක් නිසාය. සාරාගේ නමද සාරයි ලෙස මාරු කලේය. මන්ද අද බොහෝ ජාතීන්ගේ මවක් නිසාය. ***(උත්පත්ති 17:1-16)*** දෙවියන් වහන්සේගේ පොරොන්දුවට අනුව සාරාට දරුවෙක් ඉපදුනේය. ඔහුට ඊසාක් යන නම තැබීය. එවිට ආබ්‍රහම්ගේ වයස අවුරුදු 100 ක් වූ අතර සාරාගේ වයස අවුරුදු 90 කි. දෙවියන්වහන්සේට කළ නොහැකි දෙයක් නැත.

## මහත් සෝදිසියක්

දැන් දෙවියන්වහන්සේ ආබ්‍රහම්ව සෝදිසි කිරීමට තීරණය කලේය. දෙවියන්වහන්සේ ඔහුට කථා කරමින් නුඹගේ එකම පුත්‍රවූ නුඹ බොහෝ ප්‍රිය කරන්නාවූ ඊසාක්ව රැගෙන මම නුඹට පෙන්වන්නාවූ මොරියා කන්දට ගොස් ඔහුව දවන පූජාවක් ලෙස ඔප්පු කරන්නය කීය. ආබ්‍රහම්ද මේ දේ ඇසූ විට දෙවියන්වහන්සේ මට දුන් එකම පුතාව නැවත මගෙන් ඉල්ලනවාද? කියා සිතන්නට ඇත.

එහෙත් ඔහු තමාගේ එකම පුතාවද රැ ගෙන දර සහ ගින්දරත් සමඟ ඊසාක්ව පූජා කරන පිණිස මොරියා කන්දට ගියේය. ඔවුන් කඳු මුදුන දක්වා යන විටදී, දර සහ ගින්දර තිබුනත් පූජාවට අවශ්‍ය බැටළු පැටවා කොහිද කියා ඊසාක් අසනු ලැබීය. එවිට ආබ්‍රහම්, 'මාගේ පුත්‍රය ස්වාමීන්වහන්සේ සපයන සේක' කියා පවසනු ලැබීය. ආබ්‍රහම් අල්තාරය ගොඩනගා ඔහුගේ අත් පාද බැඳ එම අල්තාරයෙහි තැබුවේය. ඉන් පසු ආබ්‍රහම් තම පුත්‍රයාව පූජා කරන පිණිස පිහිය එසවූ විට දෙවියන්වහන්සේ ඔහුට කථා කරමින්, 'ආබ්‍රහම්, ආබ්‍රහම් නුඹගේ පුත්‍රයාට අත නොතබන්න. නුඹ දෙවියන්වහන්සේට භය වෙන්නාවූ කෙනෙක් බව මා දනිමි. නුඹගේ එකම පුත්‍රයා මා හට පූජා කිරීමට කැපවූවා, එබැවින් ඔහු පිට අත නොතබන්න' කියා පවසනු ලැබීය. ''ආබ්‍රහම් පරීක්ෂා කරනු ලැබූ කල, ඇදහිල්ලෙන් ඊසාක් පූජා කලේය. එසේ, නුඹේ වංශය ප්‍රකාශවන්නේ ඊසාක්ගෙන්යයි යමෙකුට කියනලද්දේද, ඒ පොරොන්දු සංතෝෂයෙන් පිළිගත් ඔහු තමාගේ ඒකජාතක පුත්‍රයාව පූජාකරමින් සිටියේය. මළවුන්ගෙන් පවා නැගුටුවන්ට දෙවියන්වහන්සේට පුළුවනැයි ඔහු කල්පනා කොට උදාහරණ වශයෙන් මරණයෙන් ඔහු නැවත ලබා ගත්තේය.'' ***(හෙබ්‍රෙව් 11:17-19)*** ආබ්‍රහම් දෙවියන්වහන්සේව විශ්වාස කලෝය. එය ඔහුගේ ධර්මිෂ්ඨකම විය. (ගලාති 3:6) දෙවියන්වහන්සේ ආබ්‍රහම්ව ඇදහිල්ලේ පියා ලෙස නම් කරනු ලැබීය.

ආදම්ගේ අකීකරුකම නිසා ඔහුගේ ජීවිතය පරාජයට පත්විය. නෝවා ධර්මිෂ්ඨ පුද්ගලයෙක් වුවත් ඔහුගේ පරම්පරාව අසාර්ථක විය. එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේට කැපවුනා වූ පරම්පරාවක් තෝරා ගැනීමට කැමති විය. ***''වංශයක් උන්වහන්සේට මෙහෙකරන්නේය. මතු පරම්පරාවට ස්වාමීන් ගැන එපවත් කියනු ලබන්නේය.'' (ගීතාවලිය 22:30)***

## දාවිත් රජතුමා

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට රජෙක් විය. සාමුවෙල් ඔහුට ප්‍රොපේතවරයෙක් හා විනිශ්චය කරන්නෙක්ව සිටියේය. ඉශ්‍රායෙල් සෙනඟ සාමුවෙල් වෙතට පැමිණ අන්‍ය ජාතීන්ට මෙන් තමන් වෙනුවෙන් සටන් කිරීමට ඔවුන්ටද රජෙක් ඕනිය කියා පවසනු ලැබීය. සාමුවෙල් ඔවුන්ගේ ඉල්ලීමට අකමැති විය. දෙවියන්වහන්සේ සාමුවෙල්ට කථා කරමින්, ***''ස්වාමීන්වහන්සේද සෙනඟ නුඹට කියන සියල්ල ගැන ඔවුන්ගේ හඬට ඇහුම්කන්දීපන්න. මක්නිසාද ඔව්හු එපාකලා නොව, මා ඔවුන් කෙරෙහි රජකම් නොකරන පිණිස මා එපා කළෝය.'' (1 සාමුවෙල් 8:7)*** බෙනජමින්ගේ ගෝත්‍රයේ කීෂ්ගේ පුත්‍රවූ සාවුල් ඉශ්‍රායෙල් හී රජ ලෙසට තෝරාගනු ලැබීය.

දෙවියන්වහන්සේ අමලෙක්වරුන්ට විරුද්ධව සිට ඔවුන්ට දඬුවම් දිය යුතුය කියා සාවුල්ට පවසනු ලැබීය. ඔවුන් සතු සෑම දේම විනාශකර දමන ලෙසට පවසනු ලැබුවත් සාවුල් හා ඔහුගේ හමුදාව අමලෙක්වරුන්ට පහර දී ඔවුන්ගේ රජුව අල්ලාගෙන සියලු දෙනාවම විනාශ කරනු ලැබීය. ඔවුන් එම රජතුමාව බේරමින් බැටළුවන්ගෙන් හා සතුන්ගෙන් ඉතා හොඳම දේ විනාශ නොකර තබා ගත්තේය.

ඔවුන් විනාශ කිරීමට පැවසූ දේ විනාශ නොකර තබා ගත්තේය. දෙවියන්වහන්සේගේ වචනය

....Contd. to page 6

Pray for नहेम्याह बाइबल कॉलेज
रेसिडेन्शल कॉलेज, चेन्नई।

माध्यमः हिन्दी

सदस्यता के लिए पंजीकृत उम्मीदवार - ATA

सुविख्यात अंतर्राष्ट्रीय मसीही अगुवे तथा पिछले 53 वर्षों से सेवारत वरिष्ठ पासवान

सर्टिफिकेट इन थियोलॉजी — 1 साल
डिप्लोमा ऑफ थियोलॉजी — 2 साल

योग्यता 10 वी या अधिक
जल्दी करें!

Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org

★ ऑनलाइन कक्षाएं उपलब्ध हैं ★

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**__පුබුදු__ කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**__පෙබ: 19__-** ගෝලත්ව පෙරමුණු පුහුණු සේවාවන් ගැන ස්තුති කරන්න.

**__පෙබ: 20__-** මතෙව් 28:18-20 කොටස කියවා යේසුස්වහන්සේගේ වර්තමාන ගෝලයන් ගැන ස්තුති කරන්න

**__පෙබ: 21__-** යේසුස්වහන්සේට ගෝලයන් ලෙස සේවය කිරීමට කැපවීමක් ඇති අය ගැන ස්තුති කරන්න.

**__පෙබ: 22__**- කිතුණුවන්ට යක්ෂයාගේ උපාය වලට විරුද්ධව සිටීමට පුළුවන් වීම ගැන ස්තුති කරන්න

**__පෙබ: 23__**- සාගත, වසංගත හා භූමිකම්පා වලින් යේසුස්වහන්සේගේ අනුගාමිකයන් ආරක්ෂා කරන දෙවිඳුන්ට ස්තුති කරන්න

**__පෙබ: 24__**- භාෂා 17 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති කරන්න.

**__පෙබ: 25__**- ශුභාරංචියේ රහස දැන්වීමට භය නැතිව මුඛය අරින කිතුණුවන් ගැන ස්තුති කරන්න.

**__පෙබ: 26__**- ක්‍රිස්තුස්වහන්සේගේ දාසයන් මෙන් සිතින් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන අය ගැන ස්තුති කරන්න.

**__පෙබ: 27__**- සියලු කාලවලදී ආත්මයාණන් කරණකොටගෙන යාච්ඤා කරන අය ගැන ස්තුති කරන්න.

**__පෙබ: 28__**- ප්‍රීතියෙන් යාච්ඤා ඔප්පු කරන අය ගැන ස්තුති කරන්න.

**__2022 මාර්තු මාසය__**

**__මාර්: 01-__** ක්‍රිස්තුස්වහන්සේ ශුභාරංචියට ඔබින ලෙස හැසිරෙන අය ගැන ස්තුති කරන්න.

**__මාර්: 02__-** භයෙනුත් වෙව්ලුමෙනුත් ගැළවීම ඉෂ්ටකරගන්නා අය ගැන ස්තුති කරන්න.

**__මාර්: 03__-** පස්සෙන් තිබෙන දේ මතක නැතිකොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගෙන යන කිතුණුවන් ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**__මාර්: 04__-** කිතුණුවන් ස්වාමීන්වහන්සේ තුළ නිතරම ස්ථිරව සිටින පිණිස යාච්ඤා කරන්න

**__මාර්: 05__-** කිතුණුවන් ස්වාමීන්වහන්සේ තුළ නිතරම ප්‍රීතිවෙන පිණිස යාච්ඤා කරන්න

**__මාර්: 06__-** කිතුණුවන් ස්වාමීන්වහන්සේ තුළ නිතරම එක්සිත් වන පිණිස යාච්ඤා කරන්න.

**__මාර්: 07__-** කිතුණුවන් ස්වාමීන්වහන්සේ තුළ යහපත් ක්‍රියා වලින් ඵල දරන පිණිස යාච්ඤා කරන්න

**__මාර්: 08__-** කිතුණුවන් ස්වාමීන්වහන්සේ තුළ සියලු ආකාර ප්‍රඥාව හා ආත්මික නුවණ ලබන ලෙස යාච්ඤා කරන්න

**__මාර්: 09__-** කිතුණුවන් ස්වාමීන්වහන්සේට ඔබින ලෙස සියලු ආකාරයෙන් ප්‍රසන්නව හැසිරෙන පිණිස යාච්ඤා කරන්න

**__මාර්: 10__-** කිතුණුවන් ස්වාමීන්වහන්සේ තුළ කිසිදු ආකාරයකින් මුලා නොවන පිණිස යාච්ඤා කරන්න.

**__මාර්: 11__-** කිතුණුවන් ස්වාමීන්වහන්සේට එකඟ නැනැත්තාවූ මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝග වලට කොල්ලයක් නොවන පිණිස යාච්ඤා කරන්න

**__මාර්: 12__-** කිතුණුවන් තම මුඛයෙන් නික්මෙන බොරුව හා කැත කතා පහකරගන්නා පිණිස යාච්ඤා කරන්න

**__මාර්: 13__-** කිතුණුවන් තම ශරීරය තුළින් වෛශ්‍යාකමත් අපිරිසිදුකමත් කාමරාගයත් නසන පිණිස යාච්ඤා කරන්න.

**__මාර්: 14__-** ක්‍රිස්තුස්වහන්සේ තුළ කිතුණුවන් උසස් තැන්හී තිබෙන දේවල් සොයන පිණිස යාච්ඤා කරන්න

**__මාර්: 15__-** කිතුණුවන්, යමෙකුට විරුද්ධව යමෙකුගේ කාරණයක් ඇත්නම් එකිනෙකාට කමාවන පිණිස යාච්ඤා කරන්න

**__මාර්: 16__-** ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය කිතුණුවන්ගේ සිත්වල ආණ්ඩු කරන පිණිස යාච්ඤා කරන්න

**__පෙබ: 17__-** කිතුණුවන්ගේ කතාව නිතරම ලුණෙන් රසවත්ව අනුග්‍රහයෙන් යුක්තව තිබෙන පිණිස යාච්ඤා කරන්න

**__පෙබ: 18__-** දෙවියන්වහන්සේගේ මුළු කැමැත්තෙහි සම්පූර්ණව නිසැකව සිටීමට කිතුණුවන්ට පුළුවන් වන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

සාමුවෙල් වෙතට පැමිණ, ***''මම සාවුල් රජකමට නොපවත්වා මාගේ වචන ඉෂ්ඨ නොකර මා අනුව යාමෙන් අහක්ව ගියේය...''*** *(1 සාමුවෙල් 15:11)* සාවුල් සාමුවෙල්ව දුටු කල දෙවියන්වහන්සේ පැවසූ දෙය මා ඉෂ්ඨ කලාය කියා පැවසීය. එවිට සාමුවෙල් ඔහුට මෙසේ පිළිතුරු දුන්නේය. ***''එසේ නම් මාගේ කන්වල වැටෙන මේ බැටළු හඬත් මට ඇසෙන ගවයන්ගේ හඬත් කිමෙක්දැයි ඇසුවේය.''*** *(1 සාමුවෙල් 15:14)* එවිට සාවුල් සාමුවෙල්ට මා මේවා ගෙන ආවේ දෙවියන්වහන්සේට පූජා කිරීමටයි කියා පවසනු ලැබීය. නමුත් සාමුවෙල් සාවුල්ට මෙසේ පවසනු ලැබීය. ***''ස්වාමීන්වහන්සේගේ හඬට කීකරුවීම පමණ දවන පූජාවලටත් යාග පූජාවලටත් ස්වාමීන්වහන්සේ ප්‍රසන්නවන සේක් ද? පූජාවට වඩා කීකරුවීමක් බැටළුවන්ගේ තෙලට වඩා ඇහුම්කන් දීමත් හොඳය. මක්නිසාද කැරළිකාරකම පේන කීමේ පාපයටත් මුරණ්ඩුකම දේවතාවන් හා රූප ඇදහීමටත් සමානය. නුඹ ස්වාමීන්වහන්සේගේ වචනය පහකල නිසා උන්වහන්සේ නුඹ රජකමෙන් පහකල සේක.*** *(1 සාමුවෙල් 15:22-23)*

## දාවිත්ව රජෙකු ලෙස ආලේප කිරීම

සාවුල්ගේ රජකම පහව ගිය කල සාමුවෙල් සාවුල් නිසා දුක් විය. දෙවියන්වහන්සේ සාමුවෙල්ට කථා කරමින් නුඹ කොපමණ කල් සාවුල් නිසා දුක් වන්නේ ද? නුඹ තෙල් කුලාව රැගෙන බෙත්ලෙහෙමෙහි සිටින යෙස්සේගේ නිවසට ගොස් ඔහුගේ පුත්‍රයන්ගෙන් කෙනෙක් වෙනුවෙන් ආලේප කරන්න. පසුව සාමුවෙල් බෙත්ලෙහෙමේ යෙස්සේගේ නිවස ආලේප කරන පිණිස කෙනෙක්ව සෙව්වේය. යෙස්සේට පුත්‍රයින් අට දෙනෙක් සිටියේය. ඔහුගේ බාල පුත්‍රයා දාවිත් විය. ඔහු පියාගේ බැටළුවන් බලා ගන්නා පිණිස ගොස් සිටියාය. සාමුවෙල් ඔහුගේ වැඩිමහල් පුත්‍රයාව දුටු විට දෙවියන්වහනසේ මොහුව තෝරාගෙන සිටීය කියා සිතුවේය. නමුත් ස්වාමීන්වහන්සේ සාමුවෙල්ට පවසනු ලැබූයේ, ***''නමුත් ස්වාමීන්වහන්සේ සාමුවෙල්ට කථාකොට ඔහුගේ පෙනීම දෙසවත් ශරීරයේ උස දෙසවත් නොබලන්න, මක්නිසාද මම ඔහු එපාකළෙමි. ස්වාමීන්වහන්සේ මනුෂ්‍යයා බලන්නාක් මෙන් නොබලනසේක. මනුෂ්‍ය තෙමේ පිටාතර පෙනීම බලන්නේය. නුමුත් ස්වාමීන්වහන්සේ සිත බලන සේක.''*** *(1 සාමුවෙල් 16:7)* මේ ආකාරයට සාමුවෙල් වෙතට පුතුන් හත් දෙනෙක් ගෙන එනු ලැබුවත් දෙවියන්වහන්සේ ඔවුන් අතරින් එක්කෙනෙක්වත් තෝරා ගත්තේ නැත. ඉන් පසුව දාවිත්ව බැටළුවන් බලා ගැනීමට ගිය ස්ථානයෙන් කැඳවා ගත්තේය. දාවිත් ඉතා කඩවසම් පෙනීමට ඉතා ලස්සන තරුණයෙක්ව සිටියේය. එවිට ස්වාමීන්වහන්සේ සාමුවෙල්ට කථා කරමින්, 'නැගිට මොහුව ආලේපකරන්න' ය කියා පවසනු ලැබීය. දාවිත්ව ආලේප කරනු ලැබූ පසු දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඔහු කෙරෙහි පැමිණියේය. නමුත් මේ වන තුරු සාවුල් රජෙක්ව සිටියේය.

## දාවිත් ගොලියත්ව මරා දැමීම

මේ දින වලටදී පිලිස්තිවරුන් ඉශ්‍රායෙල්වරුන්ට විරුද්ධව පැමිණ යුද්ධ කලේය. පිලිස්ති හමුදාව ඉශ්‍රායෙල් හමුදාව එකිනෙකාට දැකිය හැකි දුරක ඒලා යන ස්ථානයෙහි සිටියේය.

මේ කොට්ඨාශ දෙකම එකිනෙකාට මුණගැසුන විටදී පිලිස්තිවරු අතර සිටි රියන් හයහමාරක් උස ඇති ඉතා බලසම්පන්න වීරයෙක් වූ ගොලියත් නැමැති පුද්ගලයා ඉශ්‍රායෙල්ට විරුද්ධව දින 40 ක් රෑ දාවල් මහත් අභියෝග කරමින් සිටියේය.

ඉශ්‍රායෙල් සෙනඟ ඔහුට විරුද්ධව නැගී සිටීමට නොහැකි වූ නිසා ඔහුට භයව සිටියේය. යෙස්සේගේ පුතුන් තිදෙනෙක් ඉශ්‍රායෙල් හමුදාවේ සිටියේය. දාවිත් තම සහෝදරයන්ට කෑම දෙන පිණිස මෙම යුධ පිටියට ආවේය. එම ස්ථානයට ගිය දාවිත් දෙවියන්වහන්සේගේ නාමයට අපහාස කරන මේ පිලිස්තියාව දුටුවේය. එවිට සාවුල් අණකර තිබුනේ, ***''ඔහු මරණ මනුෂ්‍යයා බොහෝ වස්තුවෙන් පොහොසත්කොට, තමාගේ දුව ඔහුට සරණ පාවාදී, ඉශ්‍රායෙල්හි ඔහුගේ පියාගේ පවුලට නිදහසද දෙන්නෙමි.''*** *(1 සාමුවෙල් 17:25)*

දාවිත්ගේ සහෝදරයෝ දාවිත්ට දොස් කීවේය. නමුත් දාවිත් සාවුල්ට පැවසුවේ, ***''කිසිවෙකුගේ සිත ඔහු නිසා ක්ලාන්ත නොවේවා, ඔබගේ මෙහෙකරුවා වූ මම ගොස් මේ පිලිස්තියා සමඟ සටන්කරමි.''*** *(1 සාමුවෙල් 17:32)* එපමණක් නොව, ***''ඔබගේ මෙහෙකරුවා වූ මම සිංහයාත් වලසාත් දෙන්නාම මැරුවෙමි. ජීවමාන දෙවියන්වහන්සේගේ සේනාවලට නින්දා කළ මේ අචර්මච්ඡේදිත පිලිස්තියාත් උන්ගෙන් එකෙකු මෙන් වන්නේය.''*** *(1 සාමුවෙල් 17:36)* පැවසුවේය. දාවිත් එම පිලිස්තිවරුන්ව පරාජය කරනවාය කියා ඉතා පැහැදිලිව ස්ථිරත්වයෙන් සිටියේය. සාවුල් දාවිත්ට කථාකොට ''යන්න, ස්වාමීන්වහන්සේ ඔබ සමඟ සිටින සේක'' කියා පවසනු ලැබීය.

සාවුල් යුද්ධය සඳහා අවශ්‍ය සියලුම වස්ත්‍ර දාවිත්ට පැළඳුවේය. නමුත් ඒවා පැළඳ දාවිත්ට සටනට යාමට නොහැකි විය. එබැවින් ඔහු තමාට හුරු පුරුදු කැටපෝලය සහ ගල් පහක්ද රැගෙන එය ඔහුගේ එඬේර මල්ලෙහි දමාගෙන ගොලියත් ඉදිරියට ගියේය. ඔහු පෙනීමෙන් ඉතා කුඩාව සිටි නිසා ගොලියත් දාවිත්ට සිනාසී විහිළු කරමින් 'අද දවසේ මා නුඹේ හිස කපා නුඹගේ මස් අහසේ කුරුල්ලන්ට කන්ද දෙමියි කියා අභියෝග කලේය. ගොලියත් පැමිණියේ කඩුවේ බලයෙන්ය. නමුත් දාවිත්. ***''තෝ කඩුවක්ද හෙල්ලයක්ද කුඩා හෙල්ලයක්ද රැගෙන මා ළඟට එන්නෙහිය. මම වනාහි තා නින්දා කල ඉශ්‍රායෙල් හමුදාවල දෙවිවූ සේනාවල ස්වාමීන්වහන්සේගේ නාමයෙන් තා ළඟට එමි. අද දවසේ ස්වාමීන්වහන්සේ තා මා අතට පාවාදෙනසේක. මම තට ගසා, තාගේ හිස කපාදමා පිලිස්තිවරුන්ගේ සේනාවේ මළකඳන් අද දවසේ ආකාශයේ පක්ෂීන්ටද පොළොවේ වන මෘගයන්ටද දෙන්නෙමි. මෙසේ ඉශ්‍රායෙල් කෙරෙහි දෙවි කෙනෙක් ඉන්න බව පොළොවේ සියල්ලම දැන ගන්නවා ඇත. ස්වාමීන්වහන්සේ කඩුවෙන් හා හෙල්ලයෙන් නොගලවන බව මේ මුළු සමූහයාත්***

***දැනගන්නවා ඇත. මක්නිසාද යුද්ධය ස්වාමීන්වහන්සේගේය. උන්වහන්සේ ද නුඹලා අප අතට පාවාදෙන සේක.'' (1 සාමුවෙල් 17:45-47)*** ලෙස පවසනු ලැබීය.

දාවිත් ගලක් රැගෙන කැටපෝලයෙහි තබා පිලිස්තියාගේ නලලට ගැසුවේය. ඔහු බිම වැටුනේය. එවිට දාවිත් ඔහු වෙතට දුවගොස් පිලිස්තියාගේ ඇඟ උඩ නැග ඔහුගේ කඩුව ගෙන බෙල්ල කපා ඔහුව මරනු ලැබීය. මෙය දුටු පිලිස්තිවරු සියල්ලෝම පලා යාමට පටන්ගත්තේය. එවිට යුදාවරු ඔවුන් පිටුපසින් එලවාගෙන ගොස් ඔවුන්ව විනාශ කලේය. දාවිත් ගොලියත්ගේ හිස රැගෙන යෙරුසෙලමට ආවේය.

ඒ දවස යෙරුසෙලමට සැමරීමක් විය. කාන්තාවන් සියල්ලෝම පාරට බැස නටමින් ගීතිකා කිවෝය. ඔවුන් පැවසුවේ,

''සාවුල් දහසක්ද දාවිත් දස දහසක්ද මැරීය'' යනුවෙනි. මෙය ඇසූ සාවුල්ට ඊර්ශ්‍යයාවක් ඇතිවිය. දාවිත්ව ඉතා ඉක්මනින්ම ඉවත් කිරීමට අවශ්‍ය බව සිතුවේය. එදා සිට දාවිත්ව මැරීමට සාවුල් තැත්කලේය. දාවිත් ඔහුගේ මනුෂ්‍යයන් සමඟ පැන ගොස් ගුහාවල ජීවත් විය. දෙවතාවක්ම සාවුල්ව මැරීමට අවස්ථාවන් පැමිණුනත් දාවිත් ඔහුව මැරුවේ නැත. දාවිත් පවසනු ලැබුයේ, ***''ස්වාමීන්වහන්සේගේ අභිෂේකලත් තැනැත්තා වන මාගේ ස්වාමියාට විරුද්ධව මේ දේ කිරීමෙන්, එනම්, මාගේ අත දිගුකිරීමෙන් ස්වාමීන්වහන්සේ මා වළක්වන සේක්වා. මක්නිසාද ඔහු ස්වාමීන්වහන්සේගේ අභිෂේකලත් තැනැත්තාය.'' (1 සාමුවෙල් 24:6)*** ඉන්පසුව දාවිත් ශිප්පෝ කාන්තාරයට පලා ගොස් සිටියේය. ඒ ස්ථානයේ දී සාවුල් දාවිත්ව මැරීමට උත්සාහ කලද දාවිත් තම සෙනඟට පවසනු ලැබුයේ, දෙවියන්වහන්සේ ආලේප කල තැනැත්තාට විරුද්ධව අත ඔසවන්න එපා යනුවෙනි. මේ වන විට සාමුවෙල් මිය ගොස් තිබුණි. ඔහුව රාමා යන ස්ථානයෙහි තැන්පත් කරනු ලැබුවේය.

නැවත සාවුල් කෙරෙහි නපුරු පැමිණෙන්නට පටන්ගත්තේය. පිලිස්තිවරු සාවුල්ට විරුද්ධව නැගී සිටීමට පටන්ගත්තේය. එවිට සාවුල් පේන කියන ස්ත්‍රියක් වෙතට ගොස් නරක පුවතක්ද සමඟ ආවේය. යුද්ධව නැවත පටන්ගත් විට සාවුල් හා ඔහුගේ පුත්‍රයන්ද මලේය. දාවිත් ශික්ලාම් නැමති ස්ථානයෙහි සිටියේය.

දවිත් දෙවියන්වහන්සේගෙන්, ''මා යුදාහි එක් නුවරකට යන්නද?'' කියා ඇසුවේය. දෙවියන්වහන්සේ ඔහුට කථා කරමින් හෙබ්‍රොන් වෙතට යන්නය කියා යුදා කෙරෙහි රජෙක් ලෙස ආලේප කලේය. මේ වන විට දාවිත්ගේ වයස අවුරුදු 30 කි. ඉන්පසුව ඉශ්‍රායෙල්වරුද දාවිත් සමඟ ගිවිසුමක් ඇතිකර ගනිමින් ඔහුට මුළු ඉශ්‍රායෙල්හි රජෙක් ලෙස ආලේප කලේය. දාවිත් වසර 40 ක් ඉශ්‍රායෙල් ආණ්ඩු කලේය. දාවිත් යෙරුසලමට ගොස් එය අත්පත් කරගෙන එය අග නුවරක් කලේය.

දෙවියන්වහන්සේ විසින් දාවිත්ව රජෙක් ලෙස පත් කලේය. මන්ද එය ස්වාමීන්වහන්සේගේ කැමැත්ත විය.

## දාවිත් රජතුමාගේ ගුණධර්ම

(1). දාවිත් හැම දේ තුලින්ම දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරනු ලැබීය. ඔහු ගීතාවලිය පොතෙහි ගීතිකා 73 කට වඩා ලියනු ලැබීය.

(2) ඔහුට පලස්තීනයේ සිටීමට ඉඩනොදී අමලෙක්වරු ක්‍රියා කල විටදී ඔහු දෙවියන්වහන්සේට ප්‍රශංසා කලෙය. ***'සෑම කල්හිම ස්වාමීන්වහන්සේට ප්‍රශංසා කරමි. උන්වහන්සේගේ වර්ණනාව මාගේ මුඛයෙහි නිතරම පවත්නේය.'' (ගීතාවලිය 34:1)***

(3) දෙවියන්වහන්සේ ඔහුව රජෙක් ලෙස පත්කල විටදී ඔහු සැම විටම ගුණවන්තව සිටියේය. ***''උන්වහන්සේ තමන්ගේ සෙනඟවූ යාකොබ් සහ ස්වකීය උරුමය වූ ඉශ්‍රායෙල් පෝෂණය කරන පිණිස කිරි දෙන බැටළු දෙනුන් අනුවයාමෙන් ඔහු ගත්සේක. මෙසේ ඔහු තමාගේ සිතේ සත්‍යතාවෙන් ඔවුන් පෝෂණය කලේය. තමාගේ අත්වල සමර්ථකමෙන් ඔවුන්ට මඟපෙන්වීය.'' (ගීතාවලිය 78:71-72)***

(4). ***දෙවියන්වහන්සේ, 'දාවිත් මගේ හිතට එකඟ පුද්ගලයා' කියා සාක්ෂි දුන්නේය. (ක්‍රියා 13:22)***

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

(5). දාවිත් ඔහුට විරුද්ධව පැමිණි හැම කෙනාවම පරාජයට පත්කලේය. ඔහු සෑම යුද්ධයකට යාමට පෙර ඒ ගැන දෙවියන්වහන්සේගෙන් විමසීමට අමතක නොකලේය.

(6). තරුණයෙක්ව සිටියදී ඔහු සිංහයෙක්ව හා වලසෙක්ව ඔහුගේ දෑත් වලින් මරා දැම්මේය. බැටළුවන් වෙනුවෙන් ඔහුගේ ජීවිතයට දීමට මුළු ජීවිතයම කැප කලේය. යේසුස්වහන්සේ පවසනු ලැබූයේ, ''මම යහපත්වූ බැටළු එඬේරාය. යහපත් එඬේරා තම බැටළුවන් උදෙසා තම ප්‍රාණය දෙන්නේය.'' යනුවෙනි.

(7). රජෙක් ලෙස ඔහු තමාගේ සියලු වගකීම් ඉෂ්ට කලේය. ඔහු ඉශ්‍රායෙල්හි හොඳ රජෙක් විය. ඔහු රජකම් කල කාල වකවානුවේදී සෙනඟ සියලු දෙනාම සතුටින් හා ප්‍රීතියෙන් සිටියේය.

(8). දෙවියන්වහන්සේද දාවිත්ගේ මරණයෙන් පසු ඔහුගේ බීජයෙන්ම පැමිණෙන්නාවූ කෙනෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය ස්ථිර කරන බවත් ඔහුගේ බීජය කරණකොටගෙන පැමිණෙන්නාවූ තැනැත්තා දෙවියන්වහන්සේට මාළිගාවක් සාදන බවත් ඔහුගේ සිංහාසනය සදහටම පවතින පැවසීය.

(9). මේ සියල්ල මෙසේ සිදුවුවද දාවිත් බැත්ෂෙබාට විරුද්ධව වරදක් කලේය. ඔහුගේ රජ මාලිගාව ලග ඔවුන් වාසය කල අතර ඔහුගේ ස්වාමිපුරුෂයා යුද්ධයට ගිය විටදී දාවිත් උඩුමහලේ සිට ඇය ස්නානය කරන ආකාරය දැක ඔහුගේ ආශාව ඇය වෙත ඇදී ගියේය. ඔහු මනුෂ්‍යයන්ව යවා ඇයව ඔහු වෙතට ගෙන්වා ගත්තේය. ඔහු ඇය සමඟ සයනය කර නැවත ඇයව නිවසට හරිනු ලැබුවේය. පසුව ඇය ගර්භණීයව සිටින බව දැනගත් දාවිත් ඉතා කලබලයට පත් වී ඇගේ ස්වාමියාව මැරීමට තීරණය කලේය. ඒ සඳහා ඔහු ඉතා කූට උපක්‍රමයක් යොදා ගත්තේය. මෙය මෙලෙස සිදුවූ විටදී නාතාන් නැමති දෙවියන්වහන්සේගේ දාසයා පැමිණ දාවිත්ගේ වරද පැවසූ විටදී දාවිත් එය පිළිගත්තේය. දාවිත් ඇඩුවේය. නමුත් දෙවියන්වහන්සේගේ දඬුවම ඔහුට ලැබුණි. ඔහු දෙවියන්වහන්සේගේ සිතට එකඟ පුද්ගලයෙක් වුවත් ඔහු පාපෝච්චාරණය කරමින් දෙවියන්වහන්සේට පැවසුවත් දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් ඔහුට කමාව දෙනු ලැබුවත් ඔහුට දඬුවම් ලැබීය. දාවිත් රජතුමා ඉශ්‍රායෙල්හි මහත් රජෙක්ව සිටියේය. ඔහුට තිබූ සියලු රාජකාරීන් නිසි ලෙස ඉටු කල අතර ඔහු රජකෙනෙක් හා පූජකයෙක්ව සිටියේය.

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේ ය. ත්‍රිත්වයේ එක්කෙනෙකි. දෙවියන්වහන්සේ ගේ පුත්‍රයාය කියා කැඳවනු ලැබීය. උන්වහන්සේ මෙසායාය, රජවරුන්ගේ රජතුමාය, ස්වාමීන්ගේ ස්වාමිතුමාය. උන්වහන්සේ රජතුමා හා උත්තම පූජකයාද වේ. උන්වහන්සේ මෙලොවට පැමිණියේ පාපය දුරලන පිණිසත්ය. එමෙන්ම උන්වහන්සේ පැමිණියේ උත්තම පූජකයා ලෙස හා රජෙක් ලෙසත්ය. උන්වහන්සේ මෙල්කිසදෙක්ට වඩා උතුම් පූජකයෙක්ය. උන්වහන්සේට පටන්ගැන්මක් හා අවසානයක් නැත. උන්වහන්සේ අද දෙවියන්වහන්සේගේ සිංහාසනයෙහි වැඩ වී සිටින සේක. (ගීතාවලිය 110:1)

## සියලු බලය යේසුස්වහන්සේට දී ඇත.

***පියාණන්වහන්සේ මේ ලෝකය විනිශ්චය කිරීමේ බලය යේසුස්වහන්සේට දී ඇත. (යොහාන් 5:22*** පියාණන්වහන්සේ සියලු බලය උන්වහන්සේට දී ඇති බව යේසුස්වහන්සේ දනී. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ වෙතින් පැමිණුනේය. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ වෙතටම යන සේක. උන්වහන්සේගේ යටත්කම පෙන්වන පිණිස ගෝලයින්ගේ පාද සේදුවේය. ***(යොහාන් 13:3-5)*** උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටුන පසු ගෝලයින් ඉදිරියේ ප්‍රකාශ වූයේ මෙසේය. ***(මතෙව් 28:18-19)***

## යේසුස්වහන්සේ නැවත එනසේක.

ආබෙල්ගේ දවසේ සිට යොහාන්ගේ බෞතීස්මය දක්වා මිය ගියාවූ සියලුම ධර්මිශ්ඨයන් පාරාදීසයෙහි විවේකයෙන් සිටිති. එසේම අළුත් ගිවිසුම කාලයෙහිදී මිය ගිය සියලුදෙනාගේ ආත්ම පාරාදීසයෙහි සිටින්නේය. ***''මක්නිසාද ස්වාමීන්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ***

************



**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** THEOLOGICAL CORRESPONDENCE COURSE

Advanced Distance Education called **Theological Correspondence Course** is available in English – 537 pages and Tamil – 652 pages for Pastors, Evangelists, Christian Leaders and for lay people who have passion to do God's Ministry! A fee of Rs. 1000/- is charged. 7 Books with 149 Chapters are supplied. **Certificate in Ministry** will be awarded. **God will bless you!**



**The Chairman, Nehemiah Bible College,**



**Echo of His Call, Post Box 2957**, CHEPAUK, CHENNAI - 600 005.
**Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858**
**E.mail : biblecor@yahoo.co.in**



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

### මගේ පසුබිම

කැඳවීමේ ප්‍රතිරාවය මාසික සඟරාව සඳහා දෙවියන්වහන්සේගේ කරුණාව අප හා සමඟ තිබෙන බැවින් අප හැම මාසයකදීම මෙය එලකරමු. එහි 'පාලු වලකින් මාලිගාවට' යනුවෙන් එලකරන කොටසෙහි වසර කීපයක්ම අප අපගේ අත්දැකීම් එහි සඳහන් කලෙමු. එසේම දෙවියන්වහන්සේ අපව රැගෙන ආ මාර්ගය ගැනද අප එහි එලකලෙමු.

තව දෙවියන්වහන්සේ ඉතා පුදුමාකාර ලෙස අපව ගෙන ආ මාර්ගය පිළිබඳව පොතක් ලියන්නය කියා ශුද්ධාත්මයාණන්වහන්සේ මට මගපෙන්වා ඒ සඳහා මාව පොළොඹවන ලදී. එසේම මා රෝගාතුරුව සිටි විටදීත් බොහෝ අමාරු අවස්ථාවන් වලදීත් දෙවියන්වහන්සේ මා හට කලාවූ බලවත් ක්‍රියාවන් දුටු බොහෝ දෙනෙක්ද මේ සඳහා මාව ඉතාමත් උනන්දු කරමින් පොතක් ලියන්නටය කියා මා හට පවසන ලදී. එසේම මා මෙලෙසෙ පොතක් ලිවීමට පටන්ගත්තත් වසර ගණනාවක්ම එය ලිවීමට ප්‍රමාද විය. 2021 දෙසැම්බර් මස 5 වන ඉරුදින සවස අප 'මිත්‍රයින්ගේ ඉරුදින' ය කියා මගේ පුතා වන ඇලෙක්ස් සෑම්ගේ උපන්දිනය දවසේදී වැඩසටහනක් පැවැත්වීමු. මෙය අවසන් වී මා නිදා ගැනීමට ගනු ලැබුයේ රාත්‍රී 12.00 ට පමණය. එවිට ශුද්ධාත්මයාණන්වහන්සේ පැය 3 ක පමණ කාලයක් මා සමඟ ගණුදෙනු කලේය.

හරියටම අලුයම 3.00 ට පමණ මා නැගිට දෙවියන්වහන්සේ මට කථා කල දේ ගැන මා ක්‍රියා කිරීමට පටන්ගත්තෙමි. මාගේ ආත්මීත ඇස් ඉදිරි පිට ස්වාමීන්වහන්සේ මෙය ලියන ආකාරය මා දුටුවා.

***"...මක්නිසාද ඔහු එක්කෙනෙක්ව සිටියදී මම ඔහු කැඳවාගෙන, ඔහුට ආශීර්වාදකොට, ඔහු වැඩිකලෙමි." (යෙසායා 51:2)***

එකිනෙහිම මම බයිබලය රැගෙන පෑනක් හා සටහන් පොතක්ද ගෙන දණගසා මා මෙසේ පැවසුවෙමි.

"ප්‍රියාදාර පියාණෙනි, මා ඔබවහන්සේට මාව භාර දෙමි. මගේ ජීවිත කථාව ලිවීම පිණිස මාව ආරක්ෂා කරමින් එම පොත ලියා අවසන්වන තුරුම ඔබගේ කරුණාව දෙන්න. එපමනක්ද නොව ස්වාමීනි මෙම පොත බොහෝ භාෂාවන් වලට මුද්‍රණය කරන්නද මා හට උපකාර කරන්නය" කියා යාච්ඤා කලෙමි. මෙම වැඩය ආරම්භ කිරීමට ස්වාමීන්වහන්සේ මා හට බලවත් ඇදහිල්ලක් දී තිබේය කියා මා විශ්වාස කරමි.

මගේ ළමා කාලයේ දී ගත් පින්තූරයක් මා සතුව නොමැත. නමුත් සහෝදරී ඩේසි මටමම පින්තූර සාදා ගැනීමට උපකාර කිරීමට සූදානම්ව සිටී. දැන් මා මෙවැනි වාතාවරණයක් තුලදී මෙය ලිවීම ආරම්භ කලෙමි.

### මගේ ළමා කාලය

මගේ මවගේ නම රෝස් ලේටිය. ඇය කල්‍යාණිකුමාරි දිස්ත්‍රික්කයේ, නෙයියූර් නුවර නෙල්අරෛයික්කෝනම් යන ගමෙහි ඉපදිනි. මගේ මුත්තා වන මාර්ත් අණ්ඩන් දැඩි හින්දු භක්තිකයෙක්ය. ඔහුගේ පුත්‍රයා වන මගේ සීයා නාරායනම් වන අතර ඔහුද හින්දු භක්තිකයෙක්ය. පසුව ඔහු දකුණු ඉන්දියාවේ මිෂනාරි සේවය තුලින් කිතුණුවෙක් ලෙසට වෙනස්විය. මගේ සීයා නානප්පු යන කාන්තාව සමඟ විවාහකරගත්තේය. ඔවුන්ගේ පළමු දුව රෝස්ලෙටිය. ඒ මගේ මවයි.

මගේ පියාගේ නම සෙල්වදාස්ය. ඔහුගේ පියා (මගේ සීයා) ගේ නම සැමුවෙල්ය. ඔවුන් දකුණු ඉන්දියාවේ නෙල්ලි අරෛයක්කෝනම් හි පිහිටි සභාවේ සාමාජිකයෙක්ය. මාගේ පියාගේ මවගේ නම මුත්තම්මාල්ය. ඇය ඇදහිලිවන්තියකි. මගේ සීයා නෙයියූර් යන ස්ථානයෙහි පිහිටි රෝහලක සෞඛ්‍ය සේවකයෙක් ලෙස සේවයෙහි යෙදී සිටියේය. යුරෝපියානු ජාතික වෛද්‍යවරයෙකු වූ සමර්වල් යටතේ ඔහු සේවයෙහි යෙදී සිටියේය. මෙම වෛද්‍යවරයා එවරස්ට් කඳු මුදුන තරණය කර ලෝක වාර්ථාවක් තැබූ කෙනෙකි. මගේ සීයා ඔහු කල සෞඛ්‍ය සේවය දේව සේවයක් ලෙස සිතමින් එය ඉටු කල අතර ඔහු ඉතා ආදර්ශමත් ජීවිතයක්ද ගත කලේය. මගේ සීයා මගේ ජීවිතයට ශක්තිමත් ආත්මික අත්තිවාරමක් දැමුවේය. එය මගේ ජීවිතයට මහත් බලපෑමක් ඇති කලේය.

(මතු සම්බන්ධයි)

************

RNI NO. TN/SIH/2006/17846


# NEHEMIAH BIBLE EVENING COLLEGE

**Pray for - Chepauk & Santhoshapuram, Chennai.**

## Medium :Tamil

*Registered Candidate for Membership*

**Recognised by International Christian Leaders & Senior Pastors for the past 53 years**

**Certificate in Theology : One year**
**Diploma in Theology : Two years**

**Qualification : 10th Standard & above** **Rush for Admission!**

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, BELLS ROAD, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org


## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.


**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com



**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd **FEBRUARY, 2022.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**


***JESUS LOVES YOU!***

To

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**